දිනමිණ The Dinamina e paper

# ශ්‍රී ලංකාවේ ආර්ථිකය සවිමත් කරන්න චීනය සුවිශේෂී කාර්යභාරයක් ඉටු කළා

## කතානායක කරූ ජයසූරිය

**මහින්ද අලුත්ගෙදර**

ගෙවී ගිය දශක හයක පමණ කාලයේ දී ශ්‍රී ලංකාව ආර්ථික වශයෙන් සවිමත් කිරීම සඳහා සමීපතම මිතුරෙකු ලෙස චීනය සුවිශේෂී කාර්යභාරයක් ඉටුකර තිබෙන බව කතානායක කරූ ජයසූරිය මහතා ප්‍රකාශ කරයි.

ශතවර්ෂ කිහිපයක් පුරා දෙරට අතර සබඳතා පවතින බව පෙන්වාදෙන ඒ මහතා චීනය සමග පවත්නා සමීප සබඳතා ශ්‍රී ලංකා ආර්ථිකයට දැවැන්ත ශක්තියක් බවද සඳහන් කරයි.

කතානායකවරයා මේ බව සඳහන් කළේ ශ්‍රී ලංකාව හා චීනය අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා ආරම්භ කොට වසර 60 ක් පිරීම නිමිත්තෙන් කොළඹ ගලදාරී හෝටලයේ දී පෙරේද (20) පැවැති සමරු උත්සවයට සහභාගි වෙමිනි. 1957 වසරේ දී ශ්‍රී ලංකාව හා චීන මහජන සමූහාණ්ඩුව අතර නිලවශයෙන් රාජ්‍යතාන්ත්‍රික සබඳතා පිහිටුවා ගෙන තිබෙන අතර 1949 දී නව චීනය නිලවශයෙන් පිළිගත් පළමු රටවල් අතරට ශ්‍රී ලංකාව ද අයත්වෙයි. චීන මහජන සමූහාණ්ඩුවේ තම මිත්‍ර රටවල් අතර පළමු වටයට ශ්‍රී ලංකාව ද අයත්වන අතර 1952 දී ශ්‍රී ලංකා චීන රබර් සහල් ගිවිසුම අත්සන් කිරීමෙන් අනතුරුව දෙරට අතර මිත්‍ර සබඳතාවය සඳහා මාර්ගය විවරවිය.

ශ්‍රී ලංකාවේ චීන තානාපති කාර්යාලය සහ ශ්‍රී ලංකා චීන සමාජ හා සංස්කෘතික සහයෝගීතා සංගමය එක්ව මේ සැමරුම් උත්සවය සංවිධානය කෙරිණි.

මෙහිදී වැඩිදුරටත් අදහස් පළකරමින් කරූ ජයසූරිය මහතා පෙන්වා දුන්නේ ශ්‍රී ලංකාව සහ චීනය අතර සබඳතා සියවස් ගණනක අතීතයට දිවයන බවත් අද වනවිට එම සබඳතා වෙළෙඳ, ආර්ථික, දේශපාලනික, සමාජයීය, සංස්කෘතික, අධ්‍යාපනික ඇතුළුව සෑම අංශයක් ඔස්සේම ව්‍යාප්ත වී තිබෙන බවත්ය. ශ්‍රී ලංකාව සහ චීනය අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා ආරම්භ කොට මේ වනවිට වසර 60ක් පමණ සම්පූර්ණ වන බව සිහිපත් කළ ඒ මහතා ඊට අමතරව ශ්‍රී ලංකා චීන සමාජ හා සංස්කෘතික සහයෝගීතා සංගමය ආරම්භ කොට වසර 20ක් සම්පූර්ණ වී තිබෙන බවද පෙන්වා දුන්නේය.




ශ්‍රී ලංකාව හා චීනය අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා ආරම්භ කොට වසර 60 ක් පිරීම නිමිත්තෙන් සංවිධානය කළ සැමරුම් උළෙල කොළඹ ගලදාරී හෝටලයේ දී පෙරේද (20) පැවැති අතර ඒ අවස්ථාවට පැමිණි කතානායක කරූ ජයසූරිය මහතාට විශේෂ තිළිණයක් පිළිගැන්වූ අයුරු.
*ඡායාරූපය - රොෂාන් පිටිපන*

දෙරට අතර සබඳතා පෙර සේම අඛණ්ඩව ඉදිරියට ගමන් කරන බව පෙන්වාදුන් කතානායකවරයා මීට දශක කිහිපයකට පෙර ශ්‍රී ලංකාව සහ චීනය අතර රබර් - සහල් ගිවිසුමක් අත්සන් කර තිබෙන අතර ඒ හරහා ලෝක වෙළෙඳපළේ මිල ගණන්වලට සාපේක්ෂව පහළ මිල ගණන් යටතේ ශ්‍රී ලංකාවට සහල් ලබාදීමට චීනය පියවර ගෙන තිබෙන බවද එම ගිවිසුම අපේ රටට අතිශය වැදගත් වූ බවද සඳහන් කළේය.

ඉතිහාසයේ සිට දෙරට අතර සබඳතා පැවැති බවට සාක්ෂි පවතින අතර වසර දෙකක් පමණ ලංකාවේ වැඩවාසය කරමින් ෆාහියන් භික්ෂුව කළ අධ්‍යයනයන් තුළින් දෙරටේ මානවීය සබඳතාවලට මූල බීජය වූ බවද බෞද්ධ මෙහෙණිසස්න ඉතා ප්‍රචලිතව ලංකාවේ පැවති අනුරාධපුර යුගයට සමගාමීව චීනයේ මෙහෙණිසස්න ආරම්භ වීම දෙස බැලීමේදී ද සාධක සහිතව අපට තහවුරු කර ගත හැකි වී තිබෙන බවද පැවසීය.

මෙහිදී අදහස් දක්වමින් ශ්‍රී ලංකාවේ චීන තානාපති කාර්යාලයේ දේශපාලන උපදේශිකා පැන්ග් චුන්ෂුළු මහත්මිය පෙන්වා දුන්නේ ලෝකයේ බොහෝ රටවල් අතර වන සබඳතාහි ඓතිහාසික තොරතුරු ගවේෂණයේ දී පොදු සාධනීය කරුණක් තිබෙන බවත් ඒ ඒ රටවල් අතර අන්තර් සබඳතා ගොඩනැගී ඇත්තේ ආර්ථික හෝ යටත්විජිතකරණය සමග බවට එයින් පැහැදිලි වන බවත්ය. එය වුවද චීනය සහ ලංකාව අතර මානවීය සබඳතා විමසීමේදී ඉතා පැහැදිලිව එහි සමාරම්භය ආගමික මුහුණුවරක් ගත්තක් බවට තහවුරු වන බවද ඇය පෙන්වා දුන්නාය.

දෙරටක් අතරේ සහයෝගිතාවය වර්ධනය කිරීමේදී ඔවුනොවුන්ගේ සිතුම් පැතුම්, හඳුනා ගැනීම වැදගත්ම සාධකය වන අතර ඒ සඳහා ප්‍රධානම මෙවලම වන්නේ භාෂාව බව පෙන්වාදුන් ඒ මහත්මිය චීන භාෂාව සිංහල භාෂාව හා සමීප බවක් නොදක්වන නමුත් ඔවුන් චීන භාෂාව දකින්නේ කඨෝර භාෂාවක් ලෙස බවද එසේ වුවද දෙරටේ ඇති මානවීය සබැඳියාව නිසාම සිංහලයන් චීන භාෂාව ද චීන ජාතිකයන් සිංහල භාෂාව ද ඉගෙන ගැනීමට දක්වන උනන්දුව පුදුම සහගත බවද පැවසුවාය. ඒ වෙනුවෙන් චීනයේ බෙයිජිං විදේශ භාෂා විශ්වවිද්‍යාලයේ ආරම්භ කරන ලද සිංහල අධ්‍යයන අංශයට වසර 56 ක් සම්පූර්ණ වී තිබෙන අතර චීන අග්‍රාමාත්‍ය චව් එන් ලයි මහතා සහ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය මේ සිංහල අධ්‍යයන අංශයට පිහිටුවීමට පුරෝගාමී මෙහෙවරක් සිදුකළ බවද සිහිපත් කළාය.

මේ අතර ශ්‍රී ලංකා චීන සමාජ හා සංස්කෘතික සහයෝගීතා සංගමයේ සභාපති ඉන්ද්‍රානන්ද අබේසේකර මහතා පෙන්වා දුන්නේ සෑම අතින්ම චීනය ශ්‍රී ලංකාවට වැදගත් බවත් සමාජ, ආර්ථික, දේශපාලනික, සංස්කෘතික, ආගමික ආදී අංශ ඔස්සේ එම සබඳතා වර්ධනය වෙමින් පවතින බවත්ය.

මේ වසරේ දී ශ්‍රී ලංකාව සහ චීනය අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා ආරම්භ කොට වසර 60ක් සම්පූර්ණ වන බවද පෙන්වා දුන් ඒ මහතා එම වසර 60ක කාලයේ දී ශ්‍රී ලංකාවේ සංවර්ධනය වෙනුවෙන් චීනය විශාල ශක්තියක් ලබාදී තිබෙන බවද දියුණුවන රටක් වශයෙන් ශ්‍රී ලංකාවට එය ඉතා වැදගත් අවස්ථාවක් බවද සඳහන් කළේය.

ශ්‍රී ලංකා චීන සහයෝගීතාවය සඳහා ගිවිසුමකට අත්සන් තැබීම, ශ්‍රී ලාංකික සිසුන්ට චීනයේ උසස් අධ්‍යාපනය හැදෑරීම සඳහා පාසල් 60කට ශිෂ්‍යත්ව පිරිනැමීම, නව වෙබ් අඩවියක් එළිදැක්වීම, චීන මිත්‍ර පාසල් නම් කිරීම, මිත්‍රත්ව උපහාර පිරිනැමීම ඇතුළු අංගයන් රැසක් ද සිදුකෙරුණු අතර ඊට සමගාමීව ව්‍යාපාරික සමුළුවක් ද පැවැත්විණි. ඊට අමතරව ශ්‍රී ලංකා චීන කාන්තා මිත්‍ර සංසද මණ්ඩපය ද ගලදාරී හෝටලයේදී ඊයේ (21) පෙරවරු 10.30 සිට පැවැත්වේ.

ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ඇමැති චන්දිම වීරක්කොඩි, බස්නාහිර පළාත් ප්‍රධාන ඇමැති ඉසුර දේවප්‍රිය, විදේශීය රටවල මිත්‍රත්වය සඳහා වන චීන ජනතා සංගමයේ උප සභාපතිනී ලින් යිත් මහත්ම මහත්මීන් ද මේ අවස්ථාවට එක්ව සිටියහ.

ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම © 2012 සියළුම හිමිකම් ඇවිරිණි.